

# වැලි කර්මාන්තයේ පාරිසරික හානිය

**ශ්‍රී** නිසා ගේ අදූරදර්ශී ක්‍රියාකලාපයන් නිසා ශ්‍රී ලංකාවේ පාරිසරික ගැටළු රැසක් උද්ගතව ඇත. ගොඩබිම දූෂණය, ජල දූෂණය, වායු දූෂණය, ශබ්ද දූෂණය ජෛව විවිධත්ව හායනය ආදි පාරිසරික ගැටලු දිනෙන් දින ම උග්‍ර වෙමින් පවතී. පොදුවේ මිනිස් සමාජය ඇතුළු මුළු ජෛව පද්ධතියට ම මුහුණ දීමට සිදුව ඇති මෙම ගැටලු පාලනය කිරීම බෙහෙවින් අසීරු කටයුත්තක් වී ඇත.

**කොළඹ විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයන අංශයේ**
**සුනිලා ජයන්ති බාලසූරිය**

රාජ්‍ය නොවන ආයතන රැසක මැදිහත් වීම මෙම ගැටලු උග්‍ර වීම කෙරෙහි ද අනෙක් අතට ඒවා පාලනය කිරීම කෙරෙහි ද බලපා ඇති ආකාරය අපට දැකගත හැකිය. මිනිසා ඇතුළු සමස්ත පරිසරයට මෙලෙස බලපෑම් කරන පාරිසරික ප්‍රශ්න අතර වැලි ගොඩ දැමීම ආශ්‍රිතව උද්ගත වී ඇති ගැටලු වර්තමානයේ බෙහෙවින් කතා බහට ලක්වන මාතෘකාවකි.

ශ්‍රී ලාංකික ශිෂ්ටාචාරය ඇරඹීමේ සිට ලංකාවට විවෘත ආර්ථිකය හඳුන්වා දීම දක්වා යුගයේ දී ලාංකිකයන් ගේ අවශ්‍යතා ඉතා සරල විය. විශේෂයෙන් නිවාස ඇතුළු ගොඩනැගිලි ඉදි කිරීමේ දී පරිසරයට සිදු වූ හානිය වර්තමානයට සාපේක්ෂව ඉතා අඩුය. නමුත් විවෘත ආර්ථිකය හඳුන්වාදීමත් සමඟ මෙරට ඉදි කිරීම් ක්ෂේත්‍රය සීඝ්‍රයෙන් වර්ධනය විය. එහිදී වැලිවලට ඇති ඉල්ලුම අධික විය. එම ඉදිකිරීම් සඳහා අවශ්‍ය වැලි දිවයින පුරා පිහිටි ගංගා අතු ගංගා සහ වෙනත් ජල මාර්ග ආශ්‍රයෙන් විශාල ලෙස ලබා ගැනීමට ජනතාව යොමු විය.

ඉදි කිරීම් ක්ෂේත්‍රයේ කොන්ක්‍රීට් මිශ්‍රණ සඳහා සිමෙන්ති බදාම සෑදීම සඳහා සිමෙන්ති බ්ලොක් ගල් සෑදීම සඳහා තාර සමඟ මිශ්‍ර කොට මාර්ග මත ඇතිරීමට ජල පෙරහන් සඳහා මෙන්ම ගෙවල් කපරාරුවට ද ගංගා වැලි විශාල වශයෙන් අවශ්‍ය වේ. මෙම කාර්යයන් ගේ මෑත කාලීනව පවත්නා විස්තෘතභාවය මත වැලි වෙළෙඳ පොළ පුළුල් හා සංකීර්ණත්වයට පත්ව ඇති බව දක්නට ලැබේ.

ගොඩනැගිලි කර්මාන්තය සඳහා ඉතාම හිතකර වැලි නිධි තැන්පත් වී ඇත්තේ රට පුරා පැතිර ඇති ගංගා පද්ධතියේ පහළ ප්‍රදේශවලය.

ගංගාවක් ආරම්භ වන ප්‍රදේශයේ බෑවුම වැඩි නිසා මෙන්ම එහි ගලා යන ජලයේ ප්‍රවේගය ඉතාම වැඩි නිසා ද එම ප්‍රදේශවල ප්‍රමාණයෙන් අසමාන රළු අවසාදිත දැකිය හැකිය. තවද ගංගාවල බෑවුම අඩු මැද ප්‍රදේශවල ද බහුල ලෙස ගං දඟර ඇති වීම සහ ජලය ගලා යාමේ ප්‍රවේගය අනුක්‍රමිකව අඩු වීම නිසා යම් තරමකට හෝ විශාලත්වයෙන් සමාන මධ්‍යම හා රළු අංශු සහිත වැලි ගංගා පතුලේ ද ගඟ මැද වැලිපර ලෙස ද ඉවුරුවල ද ගං දඟරවල ඇතුළු ඉවුරුවල ද ඇතැම් විට පැරණි ගංගා මාර්ගවල ද තැන්පත් වී වැලි නිධි සාදයි.

ගංගාවක අවසන් කොටසේ දි සියුම් සහ මධ්‍යම අංශු සහිත වැලි ගංගා පතුලේ ද, රොන්මඩ හා මැටි පිටාර තැනිවල ද නිධි සාදමින් තැන්පත් වේ. මේ අනුව ඉදි කිරීම් ක්ෂේත්‍රය සඳහා වඩාත් සුදුසු හොඳින් තේරුණු මධ්‍යම ප්‍රමාණයේ සහ මධ්‍යම රළු ප්‍රමාණයේ අංශු සහිත විශාල වැලි නිධි ගංගාවල මැද සහ පහළ ප්‍රදේශවල මෙන්ම සාගරයට ආසන්න පහළ ප්‍රදේශවල ද පිහිටා ඇත. මෙම වැලි ඉහළ ක්වාට්ස් ප්‍රතිශතයකින් හෙබි අංශු සහිත වීම එම වැලි ඉදිකිරීම් කටයුතු සඳහා උචිත වීමේ සුදුසුකම සපුරාලන සාධක වෙයි. එම හේතුව නිසා දැනට ශ්‍රී ලංකාවේ වැලි පරිභෝජනය 100% ක් ම ගංගා වැලි මත යැපෙයි.

භූ විද්‍යාඥයන් පවසන අන්දමට ශ්‍රී ලංකාවේ මෙලෙස දක්නට ලැබෙන වැලි නිධි මීට වසර මිලියන 2 ක පමණ කාලයක් තිස්සේ අවසාදිත ලෙස තැන්පත් වී ඇත. ඒවා වෙරළ වැලි, වැලි මැටි, ගංගා දියළුම හා ඔබ වෙරළත වැලි වශයෙන් වර්ගීකරණය කර ඇත. ඉදිකිරීම් කර්මාන්තය සඳහා යොදා ගනු ලබන ගංගා වැලි අයත් වන්නේ දියළුම කාණ්ඩයටය.

ශ්‍රී ලංකාවේ පවතින නීති අනුව ඕනෑම අයෙකුට ඕනෑම ස්ථානයකින් වැලි ගොඩ දැමීමට හැකියාවක් නැත. ඒ සඳහා බලපත්‍රයක් ලබා ගත යුතුය. 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 28 වැනි වගන්තියට අනුව ඕනෑම ඛනිජ ද්‍රව්‍යයක් සඳහා ගවේෂණය කිරීම. පතල් කැණීම ඒවා ප්‍රවාහනය කිරීම. සකස් කිරීම, වෙළෙඳාම් කිරීම හෝ අපනයනය කිරීම අදාළ පනතේ විධි විධානවලට යටත්ව නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ පමණක් සිදු කළ යුතුව ඇත.

භූ විද්‍යාඥයන් පවසන අන්දමට ශ්‍රී ලංකාවේ මෙලෙස දක්නට ලැබෙන වැලි නිධි මීට වසර මිලියන 2 ක පමණ කාලයක් තිස්සේ අවසාදිත ලෙස තැන්පත් වී ඇත. ඒවා වෙරළ වැලි, වැලි මැටි, ගංගා දියළුම හා ඔබ වෙරළත වැලි වශයෙන් වර්ගීකරණය කර ඇත. ඉදිකිරීම් කර්මාන්තය සඳහා යොදා ගනු ලබන ගංගා වැලි අයත් වන්නේ දියළුම කාණ්ඩයටය. ශ්‍රී ලංකාවේ පවතින නීති අනුව ඕනෑම අයෙකුට ඕනෑම ස්ථානයකින් වැලි ගොඩ දැමීමට හැකියාවක් නැත.

යම් පුද්ගයකුට වැලි කැණීමේ අවසර පත්‍රයක් නිකුත් කිරීමට වැලි කැණීමට අපේක්ෂා කරන ස්ථානය පිළිබඳ සලකා බැලිය යුතු කරුණු කිහිපයක් ඇත. එනම් කැණීම් සිදු කිරීමට තරම් වැලි සංචිතයන් අදාළ ස්ථානයේ තිබේද, එම පෙදෙසේ ගං ඉවුරු කැඩී බිඳීම්වලට ලක් වී තිබේද, එය ගඟේ නැමීම් සහිත ස්ථානයක් ද ඒ ආසන්නයේ පාලම්, ඒ දඬු ආදිය තිබේද, ගඟේ මව් පාෂාණය මතු වී තිබේද යන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම අත්‍යවශ්‍යය. මෙම කරුණුවලට අනුව සුදුසු ස්ථාන සඳහා පමණක් වැලි කැණීමේ අවසරපත් නිකුත් කරනු ලැබේ. නමුත් දැනට ක්‍රියාත්මක වන වැලි තොටුපළවලින් බලපත්‍ර සහිත වන්නේ 30% ක් පමණ සුළු ප්‍රමාණයක් බව අනාවරණය වී ඇත. ඉතිරි සියල්ල අනවසර ස්ථානවල නීති විරෝධී ලෙස වැලි ගොඩදැමීම මඟින් පාරිසරික හා දේපොළ හානි උග්‍ර කෙරේ.

ගංගාවලට සැපයෙන වැලි ප්‍රමාණය ඉක්මවා ඉවත්වන වැලි ප්‍රමාණය වර්ධනය වීමෙන් පාරිසරික සමතුලිතතාව බිඳ වැටෙන අතර ස්වාභාවිකව සිදුවන වෙරළ සංරක්ෂණ ක්‍රියාවලියට ද බාධා වේ.

වැලි නිර්මාණය වන්නේ දීර්ඝ කාලයක් පුරා සිදුවන ජීර්ණ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් වශයෙනි. ඒ අනුව වෙරළට අවශ්‍ය වැලි ගංගා මාර්ගය ඔස්සේ පරිවහනය කෙරේ. ඒ තුළින් ස්වාභාවිකව වෙරළ නිර්මාණය වේ.



නමුත් වාර්ෂිකව අති විශාල වැලි ධාරිතාවක් ගංගාවලින් ඉවත් කිරීම නිසා වෙරළ කරා අවතීර්ණ වන වැලි සංචිතය අඩු වීම තුළින් ස්වභාවික වෙරළ සංරක්ෂණ ක්‍රියාවලියට බාධා ඇති වේ.

1984 වසරේ දී පුත්තලම සිට දෙවුන්දර තුඩුව දක්වා වූ බටහිර හා නිරිතදිග වෙරළ කලාපයේ වැලි ඝන මීටර් 151000 ක් පමණ ඉවත් වී ඇත.තවද 1992 දී මහ ඔය, කැළණි ගඟ හා කළු ගඟ ආශ්‍රයෙන් සිදු කරන ලද සමීක්ෂණයකට අනුව ගංගා වැලි භාවිතයේ කාලීන වර්ධනයක් සිදු වී ඇති ආකාරය අනාවරණය වී ඇත. එම වසරේ දී මහ ඔයෙන් ගොඩ දමන ලද වැලි ප්‍රමාණය ඝන මීටර් 1890000 කි. තවද කැළණි ගඟෙන් වැලි ඝන මීටර් 822000 ක් ද කළු ගඟෙන් වැලි ඝන මීටර් 321000 ක් ද ගොඩ දමා ඇති බව වාර්තා වේ. ඒ අනුව මෙම ගංගා තුනෙන් පමණක් ඉවත් කර ඇති වැලි ප්‍රමාණය ඝන මීටර් මිලියන 3 ඉක්මවයි.

1995 වසරේ දී මුළු දිවයිනේ ම ගංගාවලින් ඉවත් කර ඇති වැලි ප්‍රමාණය ඝන මීටර් මිලියන 5 ක් ලෙස ඇස්තමේන්තුගත වාර්තා පෙන්වා දෙයි. මෙතරම් විශාල වැලි ප්‍රමාණයක් වාර්ෂිකව ගංගාවලින් ඉවත් වුවද වසරකට ස්වාභාවිකව එම ගංගාවලට එකතුවන වැලි ප්‍රමාණය ඉවත් වන වැලි ප්‍රමාණයට සමාන නොවේ. එවිට පාරිසර්ක සමතුලිතතාව බිඳ වැටේ. මෙය වැලි කර්මාන්තයේ දිගුකාලීන පැවැත්මට තර්ජනයක් වේ. වැලි ගොඩ දැමීම සිදුකරන ගං ඉවුරු දෙපස භූමිය ඛඛාදනය වීම සහ ගඟ ගැඹුරු වීම තුළින් මහජන දේපොළවලට සහ පරිසරයට සිදුවන හානිය සුළුපටු නොවේ.

වැලි ගොඩදැමීම සිදු කරන ගං ඉවුරු දෙපස භූමිය ඛාදනය වූ ඉවුරු ආසන්නයේ පිහිටි නිවාසවල ස්ථාවරත්වයට බාධා පැමිණ ඇත. එමෙන්ම ඛාදනය වූ ඉවුරු ආසන්නයේ පිහිටි කුඹුරු සහ වෙනත් වගාවන් අධික වර්ෂාවල දී ගඟ පිටාර ගැලීමෙන් පහසුවෙන් ජලයෙන් යට වේ.

තවද වර්ෂාධික කාලවල දී ගොඩබිමෙහි මතුපිට පස් තට්ටුව ඉවත්ව යාම හා ඒ ආශ්‍රිත සාරවත්භාවයට මෙම ක්‍රියාවලිය තර්ජනයක් වීමෙන් කෘෂි කටයුතුවල ඵලදායිතාව හීන වීම කෙරෙහි ද බලපෑම් සිදු වේ.

තවද වැලි ගොඩ දැමීමේ ක්‍රියාවලිය හේතුවෙන් ඉවුරු කඩාවැටීම සහ ගඟ පුළුල් වීම නිසා දෙපස ඉඩම් නායයාමට ලක් වීම සිදු වේ.

කළු ගඟ දෙපස සිදු කරන ලද එක්තරා සමීක්ෂණයක දී කළු ගඟේ සමහර ස්ථාන මීටර 1 – 5 අතර ප්‍රමාණයකින් පුළුල් වී තිබෙන ආකාරයත් ඇතැම් ඉඩම්වල පර්චස් 2 – 3 පමණ ප්‍රමාණයක් ගඟට කැඩී ගොස් ඇති ආකාරයත් දැකගත හැකි විය.

තවත් සමීක්ෂණයකදී හෙළි වී ඇති ආකාරයට මහ ඔයේ කිලෝමීටර 40 ක පමණ පරාසය තුළ වසරක දී ඉවුරු අක්කර 2 ක් පමණ ප්‍රමාණයක් කැඩී යමින් පවතින බව අනාවරණය වී ඇත.

මෙලෙස ගං ඉවුරු සීඝ්‍රයෙන් ඛාදනය වීම කෙරෙහි ප්‍රබල ලෙස බලපා ඇති සාධක වන්නේ තොටුපොළවලින් ඉවුරු ආශ්‍රිතව වැලි ගොඩට ගෙන ඒම සහ වැලි පැටවීම සඳහා වාහන තොටුපළ අසළට ගෙන යාමට ඉවුරු කඩා තොටුපොළ පුළුල් කිරීම සහ ගං ඉවුරු ආශ්‍රිතව බෝට්ටු නවත්වා තැබීමයි.

කළු ගඟෙහි දියගම, වැලිකන්ද සහ බරුහුපල යන ප්‍රදේශ 3 ආශ්‍රයෙන් සිදු කරන ලද සමීක්ෂණයක දී වැලි ගොඩදැමීම සිදු කරන ප්‍රදේශවල ගං ඉවුරු පුළුල් වී ඇති ආකාරය මනාව නිරූපණය වී ඇත.

**මූලාශ්‍රය: කළු ගඟ ආශ්‍රිතව**

**වැලි ගොඩ දැමීම සිදු කරන ප්‍රදේශවල ගං ඉවුරුවල පළලෙහි වෙනස්කම්**

| **ප්‍රදේශය** | **වැලිකණින ප්‍රදේශයේ ගඟෙහි පළල (මීටර්)** | **වැලි කැණීම් නොකරන ප්‍රදේශයේ ගඟෙහි පළල (මීටර්)** |
|---|---|---|
| දියගම | 50.4 | 48 |
| වැලිකන්ද | 56.25 | 33 |
| බරුහුපල | 49.5 | 47 |

**වැලි ගොඩදැමීමෙන් උද්ගතව ඇති පාරිසරික ගැටලු 2003**

වැලි ගොඩදැමීම නිසා ගඟ ගැඹුරු වීමේ ගැටලුව කෙරෙහි අවධානය යොමු කිරීමේ දී පාලම් වැනි ඉංජිනේරු ව්‍යුහවල අත්තිවාරම් අස්ථාවර වීම ප්‍රබල ගැටලුවක් වී ඇත.

මහ ඔය හා දැදුරු ඔය ආශ්‍රිතව සිදු කෙරෙන මහාපරිමාණ වැලි ගොඩදැමීම හේතුවෙන් අලව්ව කුරුණෑගල මහා මාර්ගයේ අලව්ව පාලම ඇතුළු වයඹ ප්‍රදේශයේ පාලම් 12 ක් දැඩි අවදානමකට ලක්ව ඇති බව දක්නට ලැබේ. “Sunday Cbserver” 1996 September 26තවද මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පනාගොඩ ප්‍රදේශයේ කළු ගඟ හරහා ඉදි කර ඇති පාලම ද බදුල්ල දිස්ත්‍රික්කයේ පාලම් කිහිපයක් ද අස්ථාවර බවට පත්ව ඇත.

වැලි ගොඩදැමීම නිසා ගං පතුල ගැඹුරු වීමෙන් වියළි කාලවල දී ළිං සිඳී යාමේ ප්‍රවණතාව කරදිය රට තුළට ගලා ඒමේ ගැටලුව සහ ගංවතුර උපද්‍රවයට ද ජනතාවට මුහුණ දීමට සිදු වී ඇත. කළු ගඟේ ගැඹුර වර්තමානයේ අඩි 12 සිට අඩි 20 දක්වා වු පරාසයක පිහිටි විවිධ ගැඹුරු මට්ටම් පෙන්නුම් කරයි. කළු ගඟේ වැලි ගොඩදමන කිමිදුම්කරුවන්ගෙන් 60% ක් අඩි 16 ත් අඩි 19 ත් අතර ගැඹුරු මට්ටමක සිට වැලි ගොඩදැමීම සිදු කරන බව අනාවරණය වී ඇත. දැදුරු ඔයේ නැගෙනහිර මානුවන්ගම කරන වැලි ගොඩදැමීම නිසා ඔය පත්ල මුහුදු මට්ටමින් අඩි 16 ක් පමණ යටට හෑරී ඇත. මේ නිසා ඔයේ ජල මට්ටම පහත බැස ප්‍රදේශයේ ළිංවල ජලය ද සීග්‍රයෙන් සිඳී යමින් පවතී.

බොහෝ ප්‍රදේශවල අසීමිත ලෙස වැලි ගොඩදැමීමෙන් ගංගා ගැඹුරු වීම ඩසා වැසි රහිත වියළි කාලවල දී ගඟෙහි ජල මට්ටම අඩු වු විට කරදිය ගඟ දිගේ ඉහළට ගලා එයි. එවිට ගඟේ මිරිදියට කරදිය හෙවත් ලවණ ජලය මිශ්‍ර වීමෙන් ගංගා ජලයේ ලවණතාව ඉහළයාම නිසා කෘෂිකාර්මික කටයුතුවලට හානි සිදු වේ. හලාවත මෝය හරහා දැදුරු ඔයට මෙලෙස කරදිය මිශ්‍ර වීම නිසා දැදුරු ඔය ආශ්‍රිත ප්‍රදේශයේ සාරවත් ගොටුකොළ, මුකුණුවැන්න සහ කෙසෙල් වගාවන් මෙන්ම කුඹුරු ද විනාශ වීමට පටන්ගෙන තිබේ. තවද ගංගා ජලයට කරදිය මිශ්‍ර වීම නිසා සමහර ප්‍රදේශවල පානීය ජල ප්‍රශ්නයක් ද නිර්මාණය වී ඇති ආකාරය දැකගත හැකිය. කොළඹ නගරයට කැළණි ගඟෙන් ජලය සපයන අඹතලේ දක්වාම සමහර කාලවල කරදිය සංක්‍රමණය වීම හේතුවෙන් ජනතාවට ජලය පානය කළ නොහැකි තත්ත්වයක් උද්ගත වේ. මෙය එක් නිදසුනක් පමණි.

යන්ත්‍රසූත්‍ර භාවිත කර වැලි ගොඩදැමීම සිදු කරන ස්ථානවල නිර්මාණය වන විශාල වළවල්වල කරදිය පිරීම හේතුවෙන් කිවුල්දිය පිරුණු තෙත් බිම් නිර්මාණය වීම ද සිදු වේ. කාටන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ මෙලෙස නිර්මාණය වූ තෙත් බිම් කිහිපයක් දැකගත හැකිය. මේ අනුව ශ්‍රී ලංකාවේ කිවුල්දිය පිරුණු තෙත් බිම් ප්‍රමාණය වැඩි වීම කෙරෙහි වැලි ගොඩදැමීම ද හේතුවක් වන බව පෙනේ.

ගංගාවල ගැඹුර වැඩි වීම ගංවතුර උපද්‍රව කෙරෙහි ද බලපෑම් ඇති කරයි. එනම් වැලි ගොඩදැමීම නිසා ගං පත්ලේ ගමන්මඟ අක්‍රමවත් ලෙස හෑරීමට ලක් වීමෙන් ගැඹුරෙහි ඇති වන විචලතාව මත ජලය ගලා යාමේ දී බාධාකාරී වේ. එවිට අධික වර්ෂා අවස්ථාවල ගංගාවේ ජලය ගලා යාමේ ස්වාභාවික රටාව අවහිර වීමෙන් අනවශ්‍ය පිටාර ගැලීම් සිදු වේ. බොහෝ විට මෙම හේතුව නිසා වැසි සමයේ ගඟේ පහළ ප්‍රදේශවල පිටාර තැන්නේ අසාමාන්‍ය ගංවතුර උපද්‍රව නිර්මාණය වනු ඇත.

වැලි ගොඩදැමීම ආශ්‍රිතව මෙලෙස උද්ගත වී ඇති ගැටලු දිනෙන් දිනම උග්‍ර වෙමින් පවතී. මේ සඳහා දිනෙන් දින වර්ධනය වන වැලි ඉල්ලුම් සහ අනවසර වැලි ගොඩදැමීම ඉහළළ යාම හේතු වී ඇත. වැලි ගොඩදැමීම සම්බන්ධව පවතින නීති රීති අනුව කිසිම අයුරකින් කිසිම වාහනයක් ගඟට බැස්සවීමට අවසර දෙනු නොලැබේ. තවද වාහන බැස්සවීම සඳහා ගං ඉවුර කපා හෙළීම ද නීති විරෝධී කාර්යයක් ලෙස සළකනු ලබයි. නමුත් ශ්‍රී ලංකාවේ බොහෝ ස්ථානවල මෙම නීති තුට්ටුවකටවත් මායිම් නොකරමින් මහාපරිමාණ ලෙස වැලි ගොඩදැමීම සිදු කරන ආකාරය දැකගත හැකිය. සිංහරාජ මායිම ඔස්සේ ගලා එන මගුරු ගඟ ආශ්‍රිත ගං ඉවුරුවල වැලි ගොඩ දැමීම මෙයට කදිම නිදසුනකි. මෙම ප්‍රදේශයේ ස්වාභාවික වන වගාව විනාශ කර ඩෝසර් යන්ත්‍ර යොදා ගනිමින් ගං පතුල දක්වාම ගං ඉවුර කපා දමා ඇත. මගුරු ගඟේ කළුගල ප්‍රදේශයේ පමණක් මෙවැනි ස්ථාන 7 ක වැලි ;ගාඩදැමීම සිදුවන අතර එයින් ස්ථාන 4 කට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අනුමැතිය ද ලැබී ඇත.

තවද 2003 වසරේ දී දැදුරු ඔයේ යකඩ කඳන් වැලි, ගල්, සිමෙන්ති යොදා මංකඩ වසා දමනු ලැබුවත් එම කණු ඉවත් කර නැවතත් වැලි ගොඩදැමීම අරඹා ඇත. ඉවක් බවක් නැතිව සිදු කරන ලද වැලි ගොඩදැමීම හේතුවෙන් උද්ගත වූ පාරිසරික ප්‍රශ්න රැසක් නිසා 2004 මාර්තු මාසයේ දී කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වැලි ගොඩදැමීම සඳහා ලබා දී තිබූ සියලු බලපත්‍ර අත්හිටුවා ඇත.

එමෙන්ම මීගමුව කොච්චිකඩේ ප්‍රදේශයේ මහාපරිමාණ ලෙස සිදුකළ වැලි ගොඩදැමීම නැවැත්වීමට ප්‍රදේශවාසීන් මෙන්ම රාජ්‍ය නියෝජිතයින් ද මහත් පරිශ්‍රමයක් දරනු ලැබු අතර එහි ප්‍රතිඵලයක් ලෙස මේ වන විට වැලි ගොඩදැමීම අත්හිටුවා ඇත. තවද ගංගා ඉවුරුවල යාන්ත්‍රික ඛනිජ කැණීම් වහාම අත්හිටුවන ලෙසත් කැණීම් බලපත්‍ර රහිතව ලබා දෙන වැලි ප්‍රවාහන බලපත් නිකුත් කිරීම වහාම අවලංගු කරන ලෙසත් පසුගියදා ශ්‍රේෂ්ඨාධිකරණය නියෝගයක් නිකුත් කළේය.

වැලි ගොඩදැමීම ආශ්‍රිතව මෙලෙස උද්ගත වී ඇති ගැටලු දිනෙන් දිනම උග්‍ර වෙමින් පවතී. මේ සඳහා දිනෙන් දින වර්ධනය වන වැලි ඉල්ලුම් සහ අනවසර වැලි ගොඩදැමීම ඉහළළ යාම හේතු වී ඇත. වැලි ගොඩදැමීම සම්බන්ධව පවතින නීති රීති අනුව කිසිම අයුරකින් කිසිම වාහනයක් ගඟට බැස්සවීමට අවසර දෙනු නොලැබේ. තවද වාහන බැස්සවීම සඳහා ගං ඉවුර කපා හෙළීම ද නීති විරෝධී කාර්යයක් ලෙස සළකනු ලබයි.

මෙලෙස වර්තමානයේ වැලි ගොඩදැමීම සම්බන්ධ නීති යම් තරමකට ක්‍රියාත්මක වුවත් තවමත් හොර රහසේ නීතිවිරෝධී ලෙස වැලි ගොඩදමන ස්ථාන රැසක් ක්‍රියාත්මකව පවතී. එමෙන්ම ඉහළ යන වැලි ඉල්ලුමට ප්‍රමාණවත් සැපයීමක් සඳහා මුහුදු වැලි ලබා ගැනීම කෙරෙහි රජයේ මෙන්ම බොහෝ ආයතනවල අවධානය මේ වන විට යොමු වී ඇත. ඒ අනුව ඉදිකිරීම් කර්මාන්තය සඳහා මුහුදු වැලි යොදාගත හැකි නම් අනාගතයේ දී ගංගා වැලි ගොඩදැමීම ආශ්‍රිතව උද්ගත වන පාරිසරික ගැටලු අවම කර ගැනීමට හැකි වනු ඇත. ❐

ග්‍රහ අපල වලට
නවරත්න මුද්දට
නියම පිරිසිදු මැණික්
ගැනීමට විශ්වාසවන්ත ස්ථානය
ජා. මැ.ස.ස් අධිකාරියේ අවසර ලත්
මැණික් හදුනන චන්ද්‍රා නාකන්දල හමුවන්න.
මැණික් වලට පූර්ණ සහතිකයක්
මැණික් ජුවලරි
238/4 මහවෙල පාර පහල බියන්විල
කඩවත. නුවර පාර 9 කණුවෙන් හැරී එන්න.
☎ 2926312
ශාඛා නැත